## දඹුල්ල මහා නගර සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මහා නගර සභා ආඥා පනතේ ( 252 වැනි අධිකාරය ) 2,3,5 සහ 9 වැනි වගන්තිවලින් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2010 පෙබරවාරි 02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයන් මගින් 2011 අප්‍රේල් 01 දින සිට ස්ථාපනය කර තිබූ දඹුල්ල මහා නගර සභාවේ 2011 අප්‍රේල් 01 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා මාස 09 ක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 30 දින වන විටත්, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 05 දින මහානගර සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී.

#### 1.2 ගණුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳව අදහස් දැක්වීම

##### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 අගෝස්තු 31 දින වන විට විගණන විමසුම් 10 කට පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළහැකි ගණුදෙනුවල වටිනාකම රු.4,982,628 ක් විය.

##### 1.2.2 මූල්‍ය පාලනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 (ඇ) ප්‍රකාරව අංක 1381001000017068 දරන බැංකු ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ මහා නගර සභාව ස්ථාපනය කළ 2011 අප්‍රේල් සිට විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2012 සැප්තැම්බර් වන විටත්, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.2.3 ආර්ථික නොවූ ගනුදෙනු

දඹුල්ල ආදාහනාගාරයේ සහ දඹුල්ල නව බස් නැවතුම්පලේ ජල බිල්පත් ගෙවීම ප්‍රමාද කිරීම නිසා ජල සම්බන්ධතාවය විසන්ධි කිරීම හේතුවෙන් යලි සම්න්ධතා ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.18,480 ක මුදලක් වැයකර තිබුණි

1.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

මහා නගර සභා ආඥා පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව විසින් කලින් සලකා බලා මහා සභාවට වාර්තා කරන තෙක්, මහා නගර සභාවක් විසින් කිසිම මුදල් පිළිබඳ කරුණක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් ක්‍රියා නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී මිළදී ගැනීම් සඳහා දරන ලද රු.1,045,248 ක වියදම් සම්බන්ධයෙන් එම ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි.

1.2.5 අවිධිමත් ගනදෙනු

(අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 139 (4) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.28,519 ක ගෙවීම් සඳහා කුවිතාන්සි ලබාගෙන නොතිබු අතර අදාළ මුදල් ලබාගත් බවට ගෙවීම් වවුචර්වල ආදායකයාගේ අත්සනද ලබාගෙන නොතිබුණි.

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 237 (ආ) ප්‍රකාරව භාණ්ඩ ලැබී ඇති බවටද අදාළ බඩු ලේඛනයෙහි, තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කළ බවට සහතිකයක් නොමැතිව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 18 කට අදාළ මිළදී ගැනීම් සඳහා රු.760,698 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 137 හා 138 ප්‍රකාරව ගෙවීම් අනුමත කිරීම හා සහතික කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී රු.1,932,148 ක මුදලක් වැයකර තිබුණි.

(ඈ) 2011 අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව සමලෝචිත වර්ෂයේ ලී බඩු හා උපකරණ මිලදි ගැනීම වෙනුවෙන් රු.1,305,252 ක වියදම් අංක 11511 නමින් වූ සාවද්‍ය වැය විෂයකට හරකර ගෙවා තිබුණි.

1.2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ). සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ගාස්තුවලින් අය කරන ලද එකතු කළ අගය මත බදු රු.137,820 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර සභාවේ ආදායමට ගෙන තිබුණි.

(ආ). දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මෝටර් ග්‍රේඩරය 2011 දෙසැම්බර් 29 දින දඹුල්ල මහා නගර සභාවට අයත් අංක CPGU 3007 දරන ගලි රථයේ ගැටීම නිසා ගලි රථයට රු.87,500 ක අලාභයක් සිදුව තිබුණි. මේ සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අභ්‍යන්තර පාලනය

(ඇ). අයවැය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). ගබඩා පාලනය